**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**

**3.5 නිර්දිෂ්ට නාට්‍යයට නව අර්ථකතනයක්**




පුණ්‍යසේන ගුණසිංහයන් විසින් උම්මග්ග ජාතකයේ එන කාළගෝල කතාව ඇසුරු කරගනිමින් නිර්මාණය කොට ඇති දික්තල කාළගෝල නාට්‍යට ඔබ ඉතාමත් කැමති බව නොඅනුමානය.දැනටමත් ඔබ එම නාට්‍ය නරඹා තිබෙනවා විය හැකිය.නාට්‍යයේදී ඒ ඒ තැන් වල අර්ථය හා හැඟීම ඉස්මතු කොට දැක්විමට යොදාගෙන ඇති ගීත නිර්මාණයන් වූ කලී ඉතා ප්‍රසස්ත මට්ටමේ ඒවාවෙයි. එමෙන් ම ඇතැම් සිද්ධීන් රඟ දැක්වීම සඳහා යොදාගනු ලබන රංග විධි ක්‍රම ද නාට්‍යට එක්කොට ඇත්තේ විචිත්‍රත්වයකි.දික්තල හා දික්පිටියා ගඟ තරණය කරන ආකාරය වැනි කොටස් තාලානුකූල චලනයන් භාවිතා කරමින් ඉතා සිත්ගන්නා සුලු අයුරින් නිර්මාණය කොට ඇත.

මෙලෙස ගලාගෙන යන නාට්‍ය නරඹද්දී ඇතැම් කොටස් වල දුර්වලතා හා තවත් නිර්මාණශීලීව ඉදිරිපත් කළ හැකියැයි ඔබට දැනෙන කොටස් හමුවනු ඇත.දික්තලාගේ දෙමාපියන් දෙදෙනා තමාගේ දියණිය සේවයේ මිළට හිලව් වශයෙන් කාළගෝලට සරණ පාවා දීම වැනි කොටස් මෙම කතා වස්තුවේ එන දුබල කොටස් ලෙස ඔබ හඳුනාගනන්ට ඇත.

නාට්‍ය රසවිඳීමේ දී ඔබට හමු වූ ඔබ කැමතිම නාට්‍ය කොටසක් නැවත නිර්මාණය කිරීමට උත්සහ කරන්න.

දික්තල කාළගෝල සම්පූර්ණ නාට්‍ය සඳහා පහත සබැඳියට පිවිසෙන්න

https://youtu.be/LPRGYExdwZI